# බෞද්ධාගමික සඞ්කල්පවලින් අර්ථාන්විත වූ පුරාතන ලංකාවේ නාගවන්දනය

(නාගවන්දනය පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්)

ආචාර්ය එම්. කේ. එල්. අයිරාංගනී[1], ගාමිණී සමරනායක[2], එන්. ජී. අයි. එම්. වික්‍රමසිංහ[3]

## හැඳින්වීම

වසල සූත්‍රය ඔස්සේ සමාජ ස්තරායනයකින් ඔබ්බට ගිය සමානාත්මතාවක් පෙන්වා දෙන බුදුදහම පරාභව සූත්‍රයේ දී බ්‍රාහ්මණ හෝ ශ්‍රමණ වේවා සෑම ආගමික පූජකයෙකුට ම ගරු කළ යුතු බව සඳහන් කරයි. ක්‍රි.පූ. හයවැනි සියවසේ දී භාරතීය ආගමික සඞ්කල්පයන් අතරින් ඉස්මතු වී ක්‍රි.පූ. තෙවැනි සියවස වන විට අවට රාජ්‍යයන් ගණනාවකට ද ව්‍යාප්ත ව ගිය බුදුදහම එතෙක් පැවති ප්‍රාථමික ආගමික සඞ්කල්පයන් ප්‍රතික්ෂේප නො කර එම සඞ්කල්පයන් බෞද්ධ දර්ශනය ඔස්සේ අර්ථාන්විත කිරීමට යොමු වී තිබේ. පර්වත වන්දනාවේ යෙදුනවුන් සධාතුක ස්තූපයන් වන්දනයටත් වෘක්ෂ වන්දනාවේ යෙදුනවුන් බෝධි වන්දනයටත් යොමු කිරීම ඊට උදාහරණ වේ. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික ඇදහිල්ලක් වශයෙන් පැවති නාගවන්දනය බුදුදහමේ ආගමනය තුළින් ප්‍රතික්ෂේප නො වූ අතර, සියවස් ගණනාවක් පුරා බුදුදහම සමඟ බද්ධ වෙමින් විකාශනය වූ බවට හමුවන සාධක රාශියකි.

## පර්යේෂණ අරමුණ

බුදුදහමේ ආගමනයට පෙර ස්වදේශික ප්‍රධාන ආගමික ඇදහිල්ලක් වශයෙන් පැවති නාගවන්දනය වෙත ආරෝපණය වූ බෞද්ධ සඞ්කල්පයන් තුළින් ඊට එක්වූ අර්ථාන්විත ලක්ෂණ හඳුනා ගැනීම ප්‍රධාන අරමුණ වන මෙම පර්යේෂණයේ දී නාගසඞ්කල්පය, කල්පිත නාගලෝකය, නාගගෝත්‍රය සහ බුදුදහමත් නාගසඞ්කල්පයත් අතර පැවති සබඳතාව අධ්‍යයනය කිරීමට ද අපේක්ෂා කරයි.

## පර්යේෂණ ක්‍රමවේදය

ප්‍රාථමික සහ ද්විතීයික සාහිත්‍ය මූලාශ්‍රයත් සෙල්ලිපි මූලාශ්‍රයත් භාවිත කරමින් ලේඛනගත සාධක සපුරාගන්නා මෙම පර්යේෂණයේ පුරාවිද්‍යාත්මක සාධක සපුරා ගැනීම උදෙසා මිහින්තලා පරිශ්‍රය, අනුරාධපුර තදාශ්‍රිත ප්‍රදේශය මෙන් ම පොළොන්නරු පැරණි අගනුවර ආශ්‍රිත ව සිදු කරනු ලබන ක්ෂේත්‍ර ගවේෂණය ද උපයෝගී කර ගනිමින් ඓතිහාසික සංසන්දනාත්මක ක්‍රමවේදය ඔස්සේ සාධක විශ්ලේෂණය කරනු ලබයි.

## පර්යේෂණ ගැටලුව

ප්‍රාථමික ආගමික ඇදහිල්ලක් වන නාගවන්දනයට බෞද්ධාගමික හරපද්ධතීන් තුළින් සිදු වූ බලපෑම මත නාග ඇදහිල්ල අර්ථාන්විතව විකාශනය වූයේ කෙසේ ද?

---

[1]. මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යාපීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලය.
*iranganimkl@yahoo.com*

[2]. පුරාවිද්‍යා කෞතුකාගාර නිලධාරී, මිහින්තලය.

[3]. මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යාපීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලය.

**පර්යේෂණ සාහිත්‍ය විමර්ශනය**

'නාග' සඬ්කේතය, 'නාග' යන නාම භාවිතය සහ දේශීය සාහිත්‍යයෙහි හඳුනා ගත හැකි නාගසඬ්කල්පය සම්බන්ධව අධ්‍යයනය කරන සරත් ඥාණසිරි මල්දෙණිය සූරීන් "චිත්‍රගත සැරසිලි මෝස්තර" කෘතියේ දී නාගරුව සහිත කැටයම් පිළිබඳ කලාත්මක අධ්‍යයනයක් සිදු කර ඇති අතර, "ශුභ සඬ්කේත" කෘතිය රචනා කරන දඹර අමිල හිමියන් නාගසඬ්කේත සහ නාගගෝත්‍රය සම්බන්ධව විග්‍රහ කර ඇත. උණුවතුරබුබුලේ මහින්ද හිමියන් "ලංකා බෞද්ධ සංස්කෘතිය" මැයෙන් රචිත කෘතියේ දී ලංකාවේ ප්‍රාථමික ඇදහිල්ලක් වශයෙන් නාගවන්දනය පැවති ආකාරය පෙන්වා දී ඇත. සතරවරම් දෙවියන් සම්බන්ධව විග්‍රහ කරන චන්ද්‍රා වික්‍රමගමගේ සූරීන් "ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රතිමා කලාව" කෘතියේ දී සතරවරම් දෙවිවරුන්ගේ රූපකායට නාගපෙණ එක් කිරීමත් සිව් දිශාවේ ආරක්ෂාව පිණිස සතරවරම් දෙවිවරුන් යෙදීමත් සම්බන්ධව පැහැදිලි කරන අතර, "ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රතිමා හා රූකම්" සම්බන්ධව විග්‍රහයක යෙදෙන යමුනා හේරත් විසින් බෞද්ධ ස්තූපයන්හි නාගසඬ්කේත යෙදීම සම්බන්ධ ව සාකච්ඡා කරයි. මේ ආකාරයේ වූ පර්යේෂණ රාශියක් අධ්‍යයනයේ දී මෙකී නාගසඬ්කේත බෞද්ධාගමික නිර්මාණයන්ට එක් වීමත් නාගවන්දනයේ යෙදුණු නාගගෝත්‍රිකයන් බෞද්ධාගමික පසුබිම තුළ තම අනන්‍යතාව පවත්වාගත් ආකාරයත් පිළිබඳ ව පර්යේෂණ රික්තකයක් පවතින බව හඳුනා ගත හැකි වූ අතර, එකී පර්යේෂණ රික්තකය පූරණය කිරීමෙහි ලා මෙම පර්යේෂණය සිදු කරනු ලබයි.

**පර්යේෂණ සාකච්ඡාව**

වර්ෂාවේ සහ සෞභාග්‍යයේ සඬ්කේතයක් වශයෙන් සලකන නාගයා සජීවී ස්වරූපයෙන් හඳුනා ගැනීමේ දී විෂ සහිත බියකරු සත්ත්වයෙකු වශයෙන් සැලකෙන අතර, ඓතිහාසික මූලාශ්‍රය අධ්‍යයනයේ දී කල්පිත නාගකොට්ඨාසයක් ද නාග නමින් හැඳින්වූ මනුෂ්‍ය කොට්ඨාසයක් ද පැවති බවට සාධක හමු වේ. සුමන නම් වූ බුදුහිමිගේ සමයේ දී බෝධිසත්ත්වයන් වහන්සේ අතුල නම් නාගරාජයෙකු ව ඉපිද විවරණ ලැබූ බව සාහිත්‍ය මූලාශ්‍රයන්හි සඳහන් වන අතර, බුද්ධත්වය අපේක්ෂාවෙන් සුජාතාවගේ කිරිපිඬු දානය වළඳා උඩුගං බලා යැවූ පාත්‍රය මහකෙළ නම් නාරජුගේ වාසස්ථානයේ තැන්පත් වී ඇත. සත්සතිය ගතකිරීමේ දී මුචලින්ද නම් නාගරාජයෙකු ගෞතම බුදුහිමිට ආරක්ෂාව සැලසූ බව සඳහන් කරන සාහිත්‍ය මූලාශ්‍රය සුමන නම් වූ නාගරාජයෙකු සොළොස්දහසක් නාගමානවිකාවන් පිරිවරා බුදුහිමිගේ ගඳකිළිය සමීපයේ වාසය කරමින් උන්වහන්සේට උපස්ථාන කළ බව දක්වයි. මීට අමතර ව සාගරය පතුලේ පවතින්නේ යැයි විශ්වාස කෙරෙන එම නාගලෝකයේ වාසය කළ ජයසේන, සුමන, නන්දෝපනන්ද, වාසුලදත්ත වැනි නාගරාජයන් සහ ඔවුන්ගේ පිරිවර බුදුසසුනේ විවිධ සංසිද්ධීත් සමඟ සම්බන්ධ වූ අවස්ථාවන් ගණනාවක් හඳුනා ගත හැකි වේ.

ශ්‍රී ලංකාවේ නාගදීපයට වැඩම කළ බුදුහිමි කණ්වඩමන් පව්වේ මහෝදර නාරජු විසින් අයගම්හි චූලෝදර නාරජු සමඟ කළ සටනක් සමථයට පත් කළ බව සඳහන් කරන මහාවංශය කැලණියේ මණිඅක්ඛික නම් නාරජුට ද ධර්මය දේශනා කළ බව දක්වයි. බුදුහිමි තම ගඳකිළිය සමීපයේ විසූ සුමන නාරජු කැඳවා ශ්‍රී ලංකාවේ මහවැලි ගඟට දකුණින් වූ සේරු නම් විල්තෙර රඳවා ගිය බව ධාතුවංශය සඳහන් කරන අතර, පසුකාලීන ව කාවන්තිස්ස රජු සේරුවාවිල ස්තූපය කරවනුයේ මෙම ස්ථානයෙහි ය. පාහියංගේ දේශාටන වාර්තාවේ ද ලංකාවේ යක්ෂයින් සහ නාගයින් වාසය කළ බව දැක්වීම සහ පෙර

සඳහන් කළ කරුණු අනුව ආර්යාගමනයට පෙර මෙරට වාසය කළ ස්වදේශික ගෝත්‍රයන් අතර 'නාග' නමින් හැඳින් වූ ගෝත්‍රයක් පවතින්නට ඇති බව තහවුරු වේ. මිහින්තලේ, රස්නකවැව, හඳගල, කොටකන්ද, කුඩුම්බිගල වැනි ස්ථානයන්හි ඇති සෙල්ලිපි කිහිපයක 'ගමික නග', 'පරුමක නග' වැනි පාලනයට සම්බන්ධ නාග නම් පුද්ගලයන් සම්බන්ධ තොරතුරු හෙළිවන අතර, 'නාගා' නමින් හැඳින්වූ කාන්තාවන් සම්බන්ධව තන්තිරිමලේ, මුතුගල්ල, එරුපොතාන වැනි සෙල්ලිපිවලින් හෙළි වේ. 'බුජ්ජනාග', 'බල්ලාටනාග', 'චෝරනාග', 'මහල්ලකනාග', 'සිරිනාග' ආදී වූ රාජ්‍ය පාලකයින්ගේ නාමයන් තුළින් ද නාග යන යෙදුම දේශීය සමාජයෙහි පරම්පරා නාමයක් හෝ ගෞරව නාමයක් ලෙසින් යෙදී ඇති බව හඳුනා ගත හැකි වේ. බුදුහිමි විසින් සුමන නාරජුට වාසස්ථාන කර දුන් සේරුවිල ප්‍රදේශයෙහි ම පිහිටි වෙල්ගම්වෙහෙර බෝධිවංශයෙහි **"නයින්ගේ වෙල්ගම්වෙහෙර"** යනුවෙන් හැඳින්වීම හේතුවෙන් මෙම අවස්ථා දෙකෙහි ම නාග යනුවෙන් යෙදී ඇත්තේ ගෝත්‍ර නාමයක් බව තහවුරු වේ. විදේශීය වෙළෙඳ කාර්යයන්හි දී වැදගත් මධ්‍යස්ථානයක් වශයෙන් වෙල්ගම්වෙහෙර ප්‍රදේශය හඳුනා ගන්නා අතර, සාහිත්‍යයෙහි නාගයින්ගේ භූමි ලෙස පෙන්වා දී ඇති කැලණිය, නාගදීපය වැනි ප්‍රදේශයන් ද සමුද්‍ර වෙළෙඳාමට සම්බන්ධ ප්‍රදේශයන් ය. නාගයින්ගේ 'භවන' සමුදුර පතුලේ පවතින බවටත් බෝධිය වැඩමවීම, දළඳා වහන්සේ වැඩමවීම වැනි අවස්ථාවන්හි දී සමුද්‍රයේ දී නාගයින්ගෙන් බාධා සිදු වූ බවටත් පවත්නා සාධක සංසන්දනය කිරීමේ දී නාග නම් ගෝත්‍රිකයන් මුහුද සමඟ සම්බන්ධ වූවන් බව හඳුනා ගත හැකි ය. ඒ අනුව සමකාලීන ව පැවති විදේශ වෙළඳාම සහ නාවික කාර්යයන්හි යෙදුන පිරිස 'නාග' යනුවෙන් හඳුන්වන්නට ඇත.

ස්වදේශික සමාජයේ ප්‍රධානතම ජනකොට්ඨාසයක් නාග නමින් හඳුන්වා ඇති බවත් නාගවන්දනය ප්‍රචලිතව පැවති බවත් මෙමඟින් තහවුරු වන අතර, ක්‍රි.පූ. තෙවැනි ශතවර්ෂයේ දී මෙරටට ආගමනය වන බුදුදහම තුළ ඔවුන් යටපත් නො කරමින් ක්‍රමික ව ඔවුන් බුදුදහමට යොමු කරවා ගැනීමට උදෙසා විවිධ ක්‍රමවේදයන් භාවිත කර ඇත. උදාහරණයක් වශයෙන් මුචලින්ද, මහාකාළ සහ සුමන යන නාරජවරුන් බුදුහිමිගේ කාලයේ පටන් ම බුදුදහමේ ආරක්ෂාව සැලසූ බුදුදහම වැළඳගත් නාගයින් වශයෙන් පෙන්වා දී ඇති අතර, බුදුදහමේ ආරක්ෂාව සලසන දිශාපාලක දෙවිවරුව් වශයෙන් නාග සහ යක්ෂ යන ප්‍රජාවන්ගේ වන්දනයට පාත්‍ර දෙවිවරුන් ආරෝපණය කර ඇත. ඒ අනුව නාගයන්ට අධිපති විරූපාක්ෂ බෞද්ධ ස්තූපයන්හි දකුණු දිශාවෙහි ආරක්ෂාව පිණිස සලකුණු කර ඇති අතර, විරූඪ සහ ධෘතරාෂ්ට්‍ර දෙවිවරුන් නාගසම්භවයක් සහිත බව ද නාගපෙණ සහිත සඞ්කේත යොදා නිර්මාණය කර ඇත. ජේතවනාරාම ස්තූපයේ වාහල්කඩ අධ්‍යයනයේ දී එහි බටහිර, නැගෙනහිර සහ දකුණු ආයකයන්හි පෙර සඳහන් කළ විරූපාක්ෂ, විරූඪ සහ ධෘතරාෂ්ට්‍ර දෙවිවරුන් නිරූපණය කරමින් මනුෂ්‍ය රුව සහිත දෙවියන්ගේ හිස පිටුපසින් නාගපෙණ දක්වා ඇති අතර, ඔවුන්ගේ භාර්යාවන් ද නාගපෙණ සහිත ව කැටයම් කර ඇත. ජේතවන ස්තූපයේ උතුරු ආයකයෙහි නිරූපිත වෛශ්‍රවණ හෙවත් කුවේර රුවෙහි නාගකැටයම් නො කර ඇත්තේ කුවේර වූ කලී රාක්ෂසයින්ගේ නියෝජනයක් හෙයිනි. මිහින්තලේ ඛණ්ඨක ස්තූපයේ ද මේ ආකාරයේ ම දිශාවන් නියෝජනය කරමින් නාගපෙණ සහිතව දෙවියන් නිරූපණය කර ඇති අතර, ජේතවන ආයකයන්හි පෙණ පහකින් යුතු දරණ බැඳගත් නාගයෙකු ඡත්‍රයක් යට හිඳින ආකාරයේ කැටයම් පුවරු පිහිටුවා තිබේ. ඡත්‍රයක් යට හිඳින බැවින් ආනන්ද කුමාරස්වාමි

සූරීන් විසින් මෙය බුදුන් වහන්සේ නිරූපිත කැටයමකැයි දක්වා ඇතත් කල්පවෘක්ෂය මුදුනෙහි ද ඡත්‍රය යෙදූ අවස්ථා ඇති හෙයින් මෙය නාගයාට ගෞරවාන්විත බවක් යෙදූ සඞ්කේතයකැයි අනුමාන කළ හැකි වේ. මිහින්තලේ නාගපොකුණ, කුට්ටම්පොකුණ සහ මින්නේරිය වැව ආසන්නයේ ජලය නිරූපණය කරමින් පෙණ පහකින් යුතු නාගයෙකු ගෙල පළඳනා සහිතව මුරගල් වශයෙන් පිහිටුවා ඇති අතර, අනුරාධපුර තදාශ්‍රිත භූමියේ සහ පොළොන්නරුවේ බොහෝ ඉපැරණි නටබුන් අතර පෙණ පහ, හත, නවය, දහතුන යන සඞ්ඛ්‍යාවන්ගෙන් යුතු ව කැටයම් කර ඇති නාගරාජ මුරගල් හඳුනා ගත හැකි වේ. මිහින්තලේ කටුසෑයේ සළපතල මළුවෙහි එකිනෙකා වෙලී සිටින නාගරූප යුගලයක් ද ඇති අතර, පොළොන්නරුවේ නයිපෙණ විහාරය වශයෙන් සැලකෙන විහාරයේ පියස්සෙහි නයිපෙණ නිර්මාණය කර ඇත.

**පර්යේෂණ නිගමනය**

සමස්තයක් වශයෙන් නාගසඞ්කේතය සහ නාගයින් සම්බන්ධව පවතින සාධක විමර්ශනය කිරීමේ දී එය බුදුදහම සමඟ අවියෝජනීය සම්බන්ධයකින් යුක්ත වන බවත් ස්වදේශික නාගගෝත්‍රිකයන් ප්‍රතික්ෂේප නො කරමින් ඔවුන් බුදුදහමේ ආරක්ෂකයන් වශයෙන් ආකර්ෂණය කරගෙන ඇති බවත් ඔවුන්ගේ ඇදහීම් බෞද්ධ සිද්ධස්ථානයන් තුළ නිරූපණය කර එතුළින් බුදුදහමට ගෞරවය ගෙන දීමට කටයුතු කර ඇති බවත් තහවුරු කරගත හැකි ය.

**ප්‍රමුඛ පද:** නාග, නාගවන්දනය, බුදුදහම, විමර්ශනය

මූලාශ්‍රය


- ශ්‍රී සුමඞ්ගල හිමි, හික්කඩුවේ සහ වෙනත් (සංස්.). (2007). **මහාවංශය.** දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- කරුණාතිලක, ඩබ්.එස්. (සංස්.). (2015). **සිංහල ථූපවංශය.** කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
- විමල් විජේරත්න, එම්. ඩබ්. (සංස්.). (2014). **සිංහල ධාතුවංශය.** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- ගම්ලත්, සුචරිත සහ වික්‍රමසිංහ, ඊ.ඒ. (සංස්.). (1996). **සිංහල බෝධිවංශය.** කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.
- Wickramasinghe, D. M. D. Z. (1994). **Epigraphia Zeylanica, volume** I. Madras: Asian Educational Services.
- මල්දෙණිය, සරත් ඥානසිරි (2016). **චිත්‍රගත සැරසිලි මෝස්තර.** කඩවත: කර්තෘ ප්‍රකාශන
- වික්‍රමගමගේ, චන්ද්‍රා (2006). **ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රතිමා කලාව.** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.